(01)(i)-C

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා

චක්‍රලේඛ ලිපි අංක 07/2020

මගේ අංකය:-PPSC/ES/14/FI/2/27-3
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත
පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය,රත්නපුර
2020.02.19

පළාත් ආදායම් කොමසාරිස්
සබරගමුව පළාත් සභාව

**<u>සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම (සීමිත බඳවා ගැනීම) සඳහා අයදුම්පත් කැඳවීම -2020</u>**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.12.10 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙහි විධායක සේවා ගණය (SL 1-2016) හා ක්ෂේත්‍රගත/කාර්යාල ගත බණ්ඩ 02 සේවා ගණය (MN 5-2016) සඳහා වන සේවා ව්‍යවස්ථාවට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/02/P2/01 හා 2020.02.13 දිනැති ලිපිය මඟින් දන්වා ඇති සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරේ පුරප්පාඩු සඳහා පහත සුදුසුකම්ලත්, සබරගමුව පළාත් ආදායම් සේවයේ නිලධාරීන්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0 අයදුම්කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම්**

(i) සබරගමුව පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

(ii) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

**2.0 සීමිත බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා ක්‍රමය**

(i) සබරගමුව පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරාගනු ලැබේ.

(ii) ජ්‍යෙෂ්ඨත්වය මත උපරිම ලකුණු 60ක් වෙන් කරනු ලැබේ.

(iii) කුසලතාවය මත (සම්මුඛ පරීක්ෂණය මගින් ) උපරිම ලකුණු 40ක් වෙන් කරනු ලැබේ.

<table>
<tr><td>ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර</td><td colspan="2">උපරිම ලකුණු</td><td>තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය</td></tr>
<tr><td>1.ජ්‍යෙෂ්ඨත්වය<br>මූලික සුදුසුකම් සපුරා වසර 05 කට වැඩි වන<br>• සම්පූර්ණ වසරකට ලකුණු 06 බැගින්<br>• මාස 06 කට වැඩි වසරකට අඩු කාලයක් සඳහා ලකුණු 03 බැගින්<br>• මාස 03 කට වැඩි මාස 06 කට අඩු කාලයක් සඳහා ලකුණු 02 බැගින්</td><td colspan="2">60</td><td rowspan="9">40%</td></tr>
<tr><td colspan="3">2.කුසලතාවය(සම්මුඛ පරීක්ෂණය මගින් )</td></tr>
<tr><td>2.1 ප්‍රඥප්ති පිළිබඳ අවබෝධය (සටහන 1)</td><td>10</td><td rowspan="7">40</td></tr>
<tr><td>2.2 අමතර අධ්‍යාපන සුදුසුකම් (සටහන 2)</td><td>05</td></tr>
<tr><td>2.3 අමතර වෘත්තීය සුදුසුකම් (සටහන 3)</td><td>07</td></tr>
<tr><td>2.4 භාෂා පිළිබඳ කුසලතාවය (සටහන 4)</td><td>03</td></tr>
<tr><td>2.5 විෂය බාහිර ක්‍රියාකාරකම් (සටහන 5)</td><td>05</td></tr>
<tr><td>2.6 ප්‍රශංසා සහ ඇගයීම්</td><td>05</td></tr>
<tr><td>2.7 සම්මුඛ සාකච්ඡාවේ දී දක්වන කුසලතාවය</td><td>05</td></tr>
<tr><td>මුළු ලකුණු</td><td colspan="2">100</td><td></td></tr>
</table>

සටහන්

1. ප්‍රඥප්තිය පිළිබඳ ව අවබෝධය
   අහඹු ලෙස ලබා දෙන අංකයට අදාලව සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රඥප්ති වලට අදාළ වගන්ති අර්ථ දැක්වීම සහ පැහැදිලි කිරීම.

2. අමතර අධ්‍යාපන සුදුසුකම් උපාධි/ඩිප්ලෝමා
   බඳවා ගැනීමේ සුදුසුකම හැර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපලේඛන 01 හි සඳහන් විෂය ක්ෂේත්‍රයන් වෙනුවෙන් ලබාගත් සහතික

   පශ්චාත් උපාධිය - ලකුණු 04
   පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 03
   උපාධි /වෘත්තීමය කුසලතා - ලකුණු 02
   ඩිප්ලෝමා - ලකුණු 01

03. අමතර වෘත්තීය සුදුසුකම්. පුහුණු/ව්‍යාපෘති

පළාත් ආදායම් සේවයේ සියලුම නිලධාරීන්ට පොදු, දින 02 හෝ ඊට වැඩි පුහුණු පාඨමාලා/වැඩමුළු සඳහා සහභාගීවීම .

දේශීය - (එක් පාඨමාලාවකට 01 ලකුණ බැගින් උපරිම 05 ක් සඳහා ) ලකුණු 05
විදේශීය - (එක් පාඨමාලාවකට 01 ලකුණ බැගින් උපරිම 02 ක් සඳහා ) ලකුණු 02

04. භාෂා පිළිබඳ කුසලතාවය

අයදුම්කරු විසින් අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු සුදුසුකමක් නොවනවිට සහ සේවයට බැඳි භාෂාව නොවන විට අනෙක් රාජ්‍ය භාෂාව වෙනුවෙන් සහ ඉංග්‍රීසි භාෂාව වෙනුවෙන්

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඩිප්ලෝමා සහතිකය - ලකුණු 02
රාජ්‍ය භාෂා පළමු මට්ටම - ලකුණු 02
රාජ්‍ය භාෂා අනෙකුත් මට්ටම් සඳහා - ලකුණු 01

අ.පො.ස සා/පෙළ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රජයේ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි/දෙමළ පාඨමාලා සහතික සඳහා එක් සහතිකයකට එක් ලකුණ බැගින් හිමි වේ.

එහෙත්, රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අනිවාර්ය නිලධාරීන් එම ප්‍රවීණතාවය වෙනුවෙන් සුදුසුකම් කිහිපයක් ලබා ගෙන ඇති විට එම අනිවාර්ය සුදුසුකම හැර අනෙකුත් සුදුසුකම් සඳහා ඉහත පරිදි ම ලකුණු ලබා දෙනු ලැබේ.

05. විෂය බාහිර ක්‍රියාකාරකම්

දෙපාර්තමේන්තුවේ පොදු කටයුතු වලදී දක්වන ක්‍රියාශීලීත්වය, ආකල්ප, අභාලය් බව, විෂයබාහිර කටයුතුවලට දක්වන සහභාගිත්වය සම්බන්ධයෙන් ලිඛිත තහවුරුවක්.

සටහන :- ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය නිශ්චය කරනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල එකතුව මත (තෝරාගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය 40% කි.) වැඩිම ලකුණු ගන්නා අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

අයදුම්කළ යුතු අන්දම

මෙහි පසුපිටේ සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් පළාත් ආදායම් කොමසාරිස්ට ඉදිරිපත් කළ යුතු ය. පළාත් ආදායම්කොමසාරිස් විසින් තමන්ට ඉදිරිපත් වූ අයදුම්පත් වහාම එකම ආවරණ ලිපියක් යටතේ ප්‍රධාන ලේකම් මගින් මෙම කොමිෂන් සභාව වෙත 2020.03.05 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය. (ප්‍රධාන ලේකම් එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතු ය.) නියමිත සුදුසුකම් සපුරා ඇතැයි පෙනී යන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා වූ විභාග ප්‍රවේශපත්‍ර අයදුම්පත්‍රයේ සඳහන් කාර්යාලීය ලිපිනයට යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

පී.එස්.ආර්.එම් විජයරාජ්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිප

ප්‍රධාන ලේකම්, ස.ප.ස - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර කාර්යාලය, ස.ප.ස - කාරුණික දැනගැනීම සඳහා

## ආදර්ශ අයදුම් පත්‍රය

## සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම (සීමිත බඳවා ගැනීම) සඳහා අයදුම්පත් කැඳවීම -2020

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම -...................................................................................

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම -...................................................................................

2.0 2.1 දැනට සේවය කරන ස්ථානයේ රාජකාරී ලිපිනය-

..................................................................................................................................

..................................................................................................................................

2.2 දුරකථන අංකය- පෞද්ගලික.................................................

කාර්යාලීය.................................................

3.0 සබරගමුව පළාත් ආදායම් සේවයේ දැනට දරණ තනතුර හා ශ්‍රේණිය ......................................................

4.0 ඉහත තනතුරට හා ශ්‍රේණියට පත් වූ දිනය..............................................................................

5.0 පළාත් ආදායම් සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ ස්ථිර කිරීමේ හා II/II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම පිළිබඳ තොරතුරු

| <u>විභාගය සමත් වූ දිනය</u> | <u>විභාග අංකය</u> | <u>ලබාගත් ලකුණු</u> |
|---|---|---|
| ................................ | .................... | ...................... |

6.0 පළාත් ආදායම් සේවයේ III පන්තියේ I ශ්‍රේණියේ පත්වීමෙහි ස්ථිර කිරීමේ ලිපියක් ලැබී තිබේ ද?

..................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

....................................

දිනය

.................................

අයදුම්කරුගේ අත්සන

පළාත් ආදායම් සේවයේ ක්ෂේත්‍රගත කාර්යාලගත ඛණ්ඩ 2 සේවාගණයේ I ශ්‍රේණියේ. ........................................මහතා/මෙනවිය/මහත්මිය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් ඒ අනුව සබරගමුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට සීමිත බඳවාගැනීමට අයදුම්කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති /නැති බවත් නිර්දේශ කරමි/නොකරමි.
(නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු සඳහන් කරන්න)

..................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ

අත්සන

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

ඉහත නම් සඳහන් අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත තොරතුරු නිවැරදිය.පසුගිය කාලය තුළ දී ඔහු/ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී ඇත/නැත.ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් ආරම්භකර ඇත/නැත.විනයානුකූල කටයුත්තක් ආරම්භ කිරීමට අදහස් කර ඇත/නැත.

..........................

දිනය

....................................

අත්සන

නම ..........................................

ප්‍රධාන ලේකම්

සබරගමුව පළාත

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)